## ශ්‍රී ලංකා නිර්වේතනික කොන්සල් කාර්යාලය, නාපෝලි
## (Honorary Consulate of Sri Lanka in Naples, Italy)

**නාපෝලි නගරයේ පිහිටි ශ්‍රී ලංකා ජනරජයේ නිර්වේතනික කොන්සල් කාර්යාලය (Honorary Consulate) මගින් පහත සඳහන් සේවාවන් කිසිදු මුදල් ගෙවීමකින් තොරව නොමිලේ ලබාගත හැකිය.**

- රෝමයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය ලියවිලි හා අයදුම්පත්‍ර ඉදිරිපත්කිරීමට පෙර, ඒවා නිවැරදිව පිරවීම හා සැකසීම සඳහා අවශ්‍ය උපදෙස් ලබාදීම.
- නිවැරදි අයදුම්පත්‍ර සහ අවශ්‍ය උපදෙස් ලබා දීම.
- දැඩි ලෙස ගිලන්ව ඇති, වයෝවෘද්ධ, ආබාධිත හෝ ගර්භණී වැනි විශේෂ අවස්ථාවන් හි පසුවන ශ්‍රී ලාංකිකයන් විසින් රෝමයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතු ලියවිලි/අයදුම්පත්‍ර/ ඡායාරූප (ගමන් බලපත්‍ර, උපත්, මරණ, දිවුරුම් ප්‍රකාශ වැනි) සහතික කිරීම.

  **(*මෙහිදී අදාළ පුද්ගලයා පෞද්ගලිකවම නිර්වේතනික කොන්සල් කාර්යාලය වෙත පැමිණිය යුතු අතර, සහතික කළ අයදුම්පත්‍ර සිය ඥාතීත්වය තහවුරු කළ හැකි පවුලේ සාමාජිකයෙකු මගින් තානාපති කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතුය. බාහිර පුද්ගලයන් හරහා ඉදිරිපත් කරනු ලබන අයදුම්පත්‍ර තානාපති කාර්යාලය බාරගනු නොලැබේ*)**
- දරුවන් හට ගුවන් ගමන් බලපත්‍ර ලබාගැනීම සඳහා කොළඹ ආගමන විගමන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ යුතු දෙමව්පියන්ගේ අනුමැතිය සඳහන් ලිපි සහතික කිරීම.
- ජීවත්වීමේ සහතික (Life Certificate)
- හදිසි ආපදාවන් නිසා රෝහල්ගත කර ඇති හෝ සිරගත වූ ශ්‍රී ලාංකිකයන්ට අවශ්‍ය කොන්සියුලර් සහය ලබා දීම
- ශ්‍රී ලාංකිකයන්ගේ විවිධ ගැටළු සම්බන්ධව නාපෝලි නගරයේ රාජ්‍ය ආයතන සමග කටයුතු කිරීම.
- ශ්‍රී ලාංකිකයන්ගේ ආගමික සංස්කෘතික හා ක්‍රීඩා වැනි පොදු කටයුතු සඳහා අවශ්‍ය සහය ලබාදීම.

**මෙම සියලුම සේවාවන් කිසිදු මුදල් ගෙවීමකින් තොරව ලබාගත හැකිය.**

ඔබගේ සියලුම රාජකාරි කටයුතු සඳහා අඟහරුවාදා, බ්‍රහස්පතින්දා සහ ඉරිදා දිනවල සවස 3.30 සිට 7.00 දක්වා නාපෝලි නගරයේ පිහිටි මෙම කාර්යාලය විවෘතව ඇත.

**නාපෝලි නගරයේ නිර්වේතනික කොන්සල්: Mr. Carmine Capasso**
**ස්ථානය: Via Santa Lucia 123, 80132 Naples, Italy**
**එසේම, හදිසි රාජකාරි කටයුතු සඳහා හෝ කලින් වේලාවක්/ දිනයක් වෙන්කර ගැනීම සඳහා දුරකථන අංක 3475512741ට අමතන්න. ෆැක්ස් අංකය : 081 2471105**

**- ශ්‍රී ලංකා තානාපති කාර්යාලය, රෝමය -**